ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } එස්පීපී/ආර්පී/ඩී/යූසීබී/05/18/02 ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2019 මැයි 31 දින.

සභාපති,

බලංගොඩ නගර සභාව.

බලංගොඩ නගර සභාවේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) උප වගන්තිය ප්‍රකාර විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

බලංගොඩ නගර සභාවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන නගර සභා ආඥා පනතේ (255 අධිකාරය) 181 (1) උපවගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) උපවගන්තියේ විධිවිධාන ප්‍රකාරව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව ඉදිරිපත් කළයුතු මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම් හැර , මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට බලංගොඩ නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01

(i) ප්‍රමිතයේ 48 ඡේදය ප්‍රකාරව ප්‍රමිත මඟින් ඉඩදී ඇති විටෙක හැර වත්කම් හා වගකීම් එකිනෙක හිලව් නොකල යුතු වුවත්, ඉදිරියට ලද කඩකුලී ආදායම් රු. 46,358 ක් ලැබිය යුතු කඩකුලී ආදායමට හිලව් කර තිබුණි.

(ii) ප්‍රමිතයේ 107 ඡේදය ප්‍රකාරව නීතිමය කටයුතු නිරවුල් කිරීම් හෙළිදරව් කලයුතු වුවත්, නගර සභාවට එරෙහිව අධිකරණයේ විභාග වන නඩු 4 ක් සහ සභාව විසින් අධිකරණයේ පවරන ලද නඩු 3 ක් සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 03 හි 47 ඡේදය ප්‍රකාරව පූර්ව කාලපරිච්ඡේද වැරදි රු. 175,709 ක් නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 09 හි 9(ආ) ඡේදය ප්‍රකාරව සේවා සැපයුමේ ස්වභාවයේ පවතින භාණ්ඩ පමණක් තොග මැනීම සඳහා අදාල කරගත යුතු නමුත් වටිනාකම රු. 57,770 ක් වූ ඉන්වෙන්ට්‍රි භාණ්ඩ 18 ක් අවසන් තොග වටිනාකමට ඇතුලත් කර තිබුණි.

(ඈ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07

(i) ප්‍රමිතයේ 14 ඡේදය ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේ දී මිළදී ගෙන තිබුණු එකතුව රු. 540,386 ක් වූ යන්ත්‍ර හා උපකරණ සහ ලිබඩු හා සවිකිරීම් ජංගම නොවන වත්කම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි.

(ii) ප්‍රමිතයේ 80 ඡේදය ප්‍රකාරව සමාලෝචිත හා ඉකුත් වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණවලින් ඉවත් කරන ලද පිරිවැය රු. 39,947 ක් වූ පුස්තකාල පොත් සහ විකුණුම් වටිනාකම රු. 57,835 ක් වූ යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ, ලී බඩු හා සවිකිරීම්වල පිරිවැය හඳුනාගෙන අදාල වත්කම් ගිණුම්වලට ගැලපීම් සිදු කර නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂය අවසාන දිනට නගර සභාව සතු ඉඩම් 20 කට අදාලව වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේදී අවසන් ගබඩා තොගය රු. 3,487,377 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි.

(ඍ) සමාලෝචිත වර්ෂය අවසාන දිනට රු.776,932 ක් වටිනා ගෙවිය යුතු ශේෂ 16 ක් ගිණුම්ගත කර නොතිබුණි.

(ඎ) සමාලෝචිත වර්ෂයේ පරිත්‍යාග වශයෙන් ලැබී තිබුණු රු. 78,741 ක් වටිනා පුස්තකාල පොත් 270 ක් ගිණුම්ගත කර නොතිබුණි.

(එ) නගර සභාවට අයත් ආයුර්වේද මධ්‍යස්ථානයේ ආරම්භක හා අවසාන තොග පිළිවෙලින් රු. 458,927 ක් හා රු. 369,262 ක් සහ සම්පත් පියසේ රු. 5,039 ක් වූ අවසන් තොගය ගිණුම්ගත කර නොතිබුණි.

(ඒ) සමාලෝචිත වර්ෂය අවසාන දිනට ඉදිරියට ලැබුණු වරිපනම් රු. 471,802 ක් වරිපනම් හා බදු පාලන ගිණුමට ගැලපුම් නොකර මිශ්‍ර තැන්පත් ගිණුමට බැරකර තිබුණි.

(ඔ) සමාලෝචිත වර්ෂය අවසාන දිනට එක්වන් මුදල් ලේඛනයේ ලැබිය යුතු කේවල ශේෂ හා එක්වන් මුදල් පාලන ගිණුමේ ශේෂ අතර රු. 431,364 ක වෙනසක් විය.

(ඕ) සමාලෝචිත වර්ෂය අවසාන දිනට නගර සභාව සතු දේපල බදු ලේඛණයේ ලැබිය යුතු කේවල ශේෂ හා නගර සභාව සතු දේපල බදු පාලන ගිණුමේ ශේෂ අතර රු. 59,050 ක වෙනසක් විය.

(ක) සමාලෝචිත වර්ෂය අවසාන දිනට බැකෝ යන්ත්‍ර කුලියට දීමේ ලේඛණයේ ලැබිය යුතු කේවල ශේෂ හා බැකෝ යන්ත්‍ර කුලී ආදායම් පාලන ගිණුමේ ශේෂ අතර රු. 68,175 ක වෙනසක් විය.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විසින් විගණනය සිදුකරන ලදී. මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමණාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරනයේ වගකීම වේ.

නගර සභාවේ මූල්‍ය වාර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබා දීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත් ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන්ගෙන් තොර බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳ සැලකිලිමත් විය යුතුය.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදු වන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිත උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස නගර සභාවේ අභ්‍යන්තර පාලනය සැලකිල්ලට ගන්නා නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- හෙළිදරව් කිරීම ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තරගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයා ගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව කළමනාකරණය දැනුවත් කරන ලදි.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) උපවගන්තිය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බව මාගේ මතය වේ.

1.6 අනුකූල නොවීම්

1.6.1. නීති ,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම්

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | වටිනාකම රු. | අනුකූල නොවීම් |
|---|---|---|---|
| (අ) | නගර සභා ආඥා පනතේ 164 (2) වගන්තිය | - | 1968 අංක 14 දරන සංචාරක සංවර්ධන පනතේ කාර්යයන් සඳහා 1987 වර්ෂයේ දී ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි කරන ලද නගර සභා බල ප්‍රදේශය තුල පිහිටි නවාතැන් පළකින් ලැබීම් මත අයකල යුතු සියයට 1 ක සංචාරක බද්ද 2018 දෙසැම්බර් දක්වා අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 1647 (ඉ) | 34,577,055 | නගර සභාවේ ඇති මෝටර් වාහන 27 ට අදාල විස්තර ඇතුලත් වාහන ලේඛනය යාවත්කාලීනව පවත්වාගෙන ගොස් නොතිබුණි. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය | | |

| | | | |
|---|---|---|---|
| (i) | 3.9.2. වගන්තිය | 11,993,714 | නගර සභාවේ සභාපතිවරයා සහ ප්‍රාදේශීය ලේකම්වරයා විසින් නම්කරනු ලබන නියෝජිතයන් දෙදෙනෙකුගෙන් සමන්විත ත්‍රිපුද්ගල කමිටුවක් මඟින් ප්‍රජාපාදක සංවිධානවල කොන්ත්‍රාත්කරුවන් තෝරාගත යුතු වුවත්, කොන්ත්‍රාත් 26 ක් සම්බන්ධයෙන් එසේ කටයුතු කර නොතිබුණි. |
| (ii) | 5.4.4.(ii) වගන්තිය | 393,629 | ප්‍රජාපාදක සංවිධාන වලට සුරක්ෂණයක් නොමැතිව රු. 200,000 ක උපරිමයකට යටත්ව අත්තිකාරම් ගෙවනු ලැබිය හැකි නමුත්, එකී විධිවිධානවලට පටහැනිව එක් කොන්ත්‍රාත්තුවක් සඳහා අත්තිකාරම් මුදල් ගෙවා තිබුණි. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2012 ජනවාරි 05 දිනැති අංක 01/2012 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3.1 වගන්තිය | 1,968,143 | ප්‍රජාපාදක සංවිධානයක් ලෙස හඳුනාගත නොහැකි බලංගොඩ ග්‍රාම නිලධාරී සුභසාධක සංගමය වෙත කොන්ත්‍රාත්තුවක් පිරිනමා තිබුණි. |

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 4,743,028 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 2,227,735 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළුහිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 8,590,000 | 8,991,122 | 7,993,892 | 4,012,406 | 8,276,000 | 8,372,029 | 8,887,800 | 3,015,177 |
| (ii) | කුලී | 24,360,000 | 28,088,669 | 28,144,527 | 804,356 | 28,633,000 | 23,387,731 | 23,031,819 | 942,067 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 4,000,000 | 3,804,125 | 3,804,125 | - | 4,042,000 | 3,165,883 | 3,165,883 | - |
| (iv) | වෙනත් ආදායම් | 28,310,000 | 24,356,748 | 23,745,450 | 160,164 | 25,175,000 | 17,644,659 | 17,509,073 | 1,549,963 |

### 2.2.2 වරිපනම් හා බදු

ඉකුත් වර්ෂවල හිඟ වරිපනම් රු. 3,306,474 ක් අයකර ගැනීමට 2019 මාර්තු වනවිටද අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබූ අතර ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී රැස් කළ වරිපනම් හා බදුවල ආදායම රු. 893,908 කින් අඩු වී තිබුණි.

### 2.2.3 කුලී

ඉකුත් වර්ෂවල හිඟ කුලී රු. 433,604 ක් අයකර ගැනීමට 2019 මාර්තු වනවිටත් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

### 2.2.4 මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් 2018 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු මුද්දර ගාස්තු හඳුනාගෙන අයකර ගැනීමට 2019 අප්‍රේල් වනවිටත් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

2.2.5 එක්වන මුදල් හා දේපල බදු මුදල්

පහත කරුණු නිරීක්ෂණය විය.

(i) බදු පදනමට ලබා දෙන ලද කඩකාමර 03 කින් 2010 සහ 2013 වර්ෂයන්ට අදාලව ලැබිය යුතු එක්වන් මුදල් එකතුව, රු. 314,748 ක් 2019 අප්‍රේල් වනවිටත් අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ii) වර්ෂ 03 සිට වර්ෂ 09 දක්වා කාලයක සිට ලැබිය යුතු දේපල බදු මුදල් එකතුව රු. 47,610 ක් 2019 අප්‍රේල් වනවිටත් අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්ය සාධනය

නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍යය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, මහජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටුකල යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

නගර සභා අඥා පනතේ 157 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 101 කින් කාරණා 70 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවීමට 2019 මාර්තු වනවිටත් කටයුතු කර නොතිබුණි.

(ආ) ඝන අපද්‍රව්‍ය කළමණාකරණය

අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය කිරීමෙන් පසු ඉතිරිවන අවශේෂ කොටස් වර්ෂයකට මෙ.ටො. 504 ක් පමණ අපද්‍රව්‍ය කළමණාකරණ මධ්‍යස්ථානයට එක්රැස්වන නමුත් එම අපද්‍රව්‍ය ද පරිසරයට අහිතකර නොවන පරිදි බැහැර කිරීමට ක්‍රමවේදයක් 2019 මාර්තු වනවිටත් සකස් කර නොතිබුණි.

(ඇ) තිරසර සංවර්ධන ඉලක්ක

තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් 2030 න්‍යාය පත්‍රය පිළිබඳව නගර සභාව දැනුවත්වී තිබුණද, සිය විෂය පථයට අනුව ළඟා කර ගත යුතු තිරසර සංවර්ධන අරමුණු, ඒ හා සම්බන්ධවන ඉලක්ක, පාදක දත්ත, ඉලක්ක ළඟා විය යුතු සංධිස්ථානයන් මෙන්ම ප්‍රගතිය මැන බැලීම සඳහා වන දර්ශකයන් හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2016 මැයි 21 වෙනි වෙසක්පුර පසළොස්වක පෝය දිනයේදී රට බීම මිලි ලීටර් 163,110 ක් බලපත්‍ර කොන්දේසිවලට පටහැනිව නගර සභාවට අයත් බලංගොඩ නානායමේ අලෙවි කිරීම සඳහා තබා ගැනිම මත රත්නපුර සහකාර සුරාබදු කොමසාරිස් විසින් 2016 අගෝස්තු 08 දින නියම කළ රු. 1,515,000 ක දඩ මුදල වගකිවයුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීමේ පදනමට සභාව විසින් වාරික 09 කින් ගෙවා තිබුණි. දඩ මුදල් වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීම සඳහා විත්තිකරුවන් තිදෙනෙකුට එරෙහිව අධිකරණයේ පවරන ලද නඩුවේ සහකාර සුරාබදු කොමසාරිස්ගේ චෝදනාපත්‍රයේ සඳහන් වෙසක් මස පුර පසළොවක පෝය දිනයේ මත්පැන් විකිණීම යන චෝදනාවද ඇතුළත්ව අනෙකුත් චෝදනා නඩුවේ චෝදනා ලෙස ඇතුළත් කිරීමට සභාව කටයුතු කර නොතිබුණි.

(ආ) දේශීය ණය සංවර්ධන අරමුදලෙන් බස් නැවතුම්පළ සහිත වෙළඳ සංකීර්ණය ඉදිකිරීම සඳහා ලබාගෙන තිබුණු ණය වෙනුවෙන් 2005 වර්ෂයේ සිට ගෙවිය යුතු ණය වාරික සහ පොළී එකතුව රු. 145,338,240 ක් ගෙවා නොතිබුණි.

(ඇ) වටිනාකම රු. 596,080 ක් වූ අගරු චෙක්පත් සහ වටිනාකම රු. 4,012,406 ක් වූ ලැබිය යුතු වරිපනම් සම්බන්ධයෙන් කාල විශ්ලේෂණ වාර්තා හා විස්තරාත්මක උපලේඛන පිළියෙල කර නොතිබුණි.

(ඇ) ඉකුත් වර්ෂවලට අදාලව එකතුව රු. 779,422 ක් වූ පළාත් පාලන විශ්‍රාම වැටුප් දායක මුදල් 2019 අප්‍රේල් වනවිටත් නිරවුල් කර නොතිබුණි.

3.3 මානව සම්පත් කළමනාකරණය

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2001 වර්ෂයේ සිට පුරප්පාඩුව පවතින ලේකම් තනතුර සඳහා නිලධාරියෙකු බඳවා ගැනීමට කටයුතු නොකර 2016 වර්ෂයේ සිට රාජ්‍ය කළමණාකරණ සහකාර සේවයේ අධි ශ්‍රේණියේ නිළධාරියෙකු වැඩ බැලීම සඳහා පත්කර තිබුණි.

(ආ) මහජන සෞඛ්‍ය පරීක්ෂක, පුස්තකාලයාධිපති, කළමණාකරණ සහකාර, ආදායම් පරීක්ෂක, පෙර පාසල් ගුරු, රියදුරු, ඖෂධ සංයෝජක, පුස්තකාල සහයක, වැඩ ක්ෂේත්‍ර කම්කරු හා සෞඛ්‍ය කම්කරු යන තනතුරු වල පවතින පුරප්පාඩු 09 ක් පිරවීමට කටයුතු කර නොතිබීමෙන් අදාළ කාර්යය සහ කර්තව්‍යයන් කාර්යක්ෂමව ඉටුකිරීමට බාධා වී තිබුණි.

(ඇ) 2016 වර්ෂයේදී කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුව මඟින් බලංගොඩ නගර සභාවේ ගිනි නිවීමේ ඒකකයේ කාර්ය මණ්ඩලයට තනතුරු 20 ක් අනුමත කර තිබුණද එම තනතුරු සඳහා පුද්ගලයන් බඳවා නොගැනීම නිසා එම ඒකකය 2019 අප්‍රේල් වනවිටත් විධිමත්ව ස්ථාපිත කිරීමට නොහැකි වී තිබුණි.

3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) විකුණනු ලබන ඉඩම් වටිනාකමින් සියයට 1 ක බදු මුදල ඉඩම් විකිණීමත් සමඟ විකුණුම්කරු විසින් සභාවට ගෙවන බවට කොන්දේසි ඇතුලත් ගිවිසුමකට එළඹීමෙන් තොරව 2015 හා 2016 වර්ෂ වලදී ඉඩම් 03 ක් වෙන්දේසි කර තිබූ අතර විකුණුම් වටිනාකම පිළිබඳ ඇගයීමක් නොකර රු. 15,500 ක් එම ඉඩම් වලින් අයකරගෙන තිබුණි.

(ආ) සණ අපද්‍රව්‍ය කළමනාකරණ පුහුණු මධ්‍යස්ථානයේ ලියාපදිංචිය අළුත් කර සණ අපද්‍රව්‍ය මෙහෙයුම් සහායක පාඨමාලාව පැවැත්වීමට ක්‍රමවේදයක් 2017 වර්ෂයේ සිට නොතිබුණු අතර 2017 වර්ෂයේ පුහුණුව අවසන් කළ 73 දෙනෙකු සඳහා අදාළ සහතික පත්‍ර ප්‍රදානය කිරීමට 2019 අප්‍රේල් වනවිටත් කටයුතු කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ අයවැය ලේඛනය අනුව සණ අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානය වැඩි දියුණු කිරීම සඳහා වන ව්‍යාපෘති 04 ක් සඳහා රු. 20,000,000 ප්‍රතිපාදන සලසා තිබූ නමුත් ප්‍රතිපාදන නොලැබීම හේතුවෙන් එම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට නොහැකි වී තිබුණි.

3.5 වත්කම් කළමනාකරණය

3.5.1 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

සභාවට පරිත්‍යාග වශයෙන් ලැබී තිබුණු වටිනාකම රු. 24,928,666 ක් වූ මෝටර්ග්‍රේඩරය ක්‍රියාකරුවකු නොමැති වීම හේතුවෙන් 2015 වර්ෂයේ සිට නිෂ්කාර්යව තිබුණි.

4. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය

4.1 අයවැය පාලනය

ප්‍රාග්ධන වියදම් සඳහා ඇස්තමේන්තු ගත ප්‍රතිපාදනයෙන් රු. මිලියන 31.68 ක් හෙවත් සියයට 70 ක, ප්‍රතිපාදන නොලැබීම හේතුවෙන් ඉතිරි වී තිබුණි.

4.2 නොවිසඳී ඇති විගණන නිරීක්ෂණ

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2008 වර්ෂයට පෙර සිට හඳුනාගත නොහැකිව ඉදිරියට ගෙන එන ලද නොපියවූ අත්තිකාරම් රු. 33,696,533 ක් නිරවුල් කිරීමට 2019 අප්‍රේල් වනවිටත් කටයුතු කර නොතිබුණි.

(ආ) ඉකුත් වර්ෂ වල සිට ඉදිරියට ගෙන එනු ලැබූ රු. 9,303,601 ක් වූ මුදල් මාරු ගිණුමේ ශේෂය 2019 අප්‍රේල් වනවිටත් නිරවුල් කර නොතිබුණි.

(ඇ) 2018 දෙසැම්බර් 31 දිනට තානායම් ගාස්තු හා තානායම් ණය ගැතියන් 98 ක ගෙන් වර්ෂ 07 කට වැඩි කාලයක සිට අයකරගත යුතු එකතුව රු. 1,033,459 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) බස් නැවතුම්පළ කඩ කාමර බදු දීමට අදාළ ගිවිසුම් ප්‍රකාරව බදුකරුවන් විසින් එකී කඩකාමර හෝ එහි යම් කොටසක බුක්තිය වෙනත් පාර්ශවයකට විකිණීම, පැවරීම හෝ අතුරු බදු දීම නොකළ යුතු වුවද, එකතුව රු. 10,100 ක මාසික කුලියකට බදු දෙන ලද කඩකාමර 02 ක් එකතුව රු. 35,000 කට අතුරු බදු දී තිබුණි. ඊට අමතරව මහජන පොලෙහි කඩකාමර බදුදීම සඳහා වූ ගිවිසුමට පටහැනිව කඩකාමර 07 ක් අතුරු බදු දී තිබුණද ඒ සම්බන්ධයෙන් 2019 මාර්තු වනවිටත් ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ඉ) බදු ගිවිසුම අනුව බදුකරු විසින් කඩ කාමරයට හෝ පොදු වෙළදපොලේ කිසියම් කොටසකට නිර්මාණාත්මක හෝ වෙනත් ආකාරයක වෙනස් කිරීමක් කවර අන්දමකින් හෝ නොකළ යුතු වුවත් මහජන පොළ පිවිසුම ඉදිරිපස කඩ කාමර 02 කට අළුතින් කොටසක් එක්කර විශාලකර තිබුණි. ඊට අමතරව ප්‍රධාන බස්නැවතුම්පලේ කඩකාමර 04 ක එකිනෙකට ගමන් කිරීමට හැකිවන පරිදි ඒවායේ ඇතුළත බිත්ති කඩා සම්බන්ධ කර තිබුණද, සභාව 2019 මාර්තු වනවිටත් ඒ සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි.

එම්.අයි. පුෂ්පා හේමමාලි,
සහකාර විගණකාධිපති,
විගණකාධිපති වෙනුවට.